**කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

*දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2023

නොවැම්බර් - 2025

**BMGT E3015 - උපායශීලී කළමනාකරණය**

ප්‍රශ්න සංඛ්‍යාව : හයයි (06) කාලය : පැය 03 යි

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

**සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.**

**ප්‍රශ්න අංක 01**

**උපායශීලී සාධක (strategic factors) හඳුනාගැනීමට, බාහිර පාරිසරික විශ්ලේෂණ ශිල්ප ක්‍රම භාවිතා කරනු ලැබේ.**

අ) බාහිර පරිසරය විශ්ලේෂණය කිරීමෙන් හඳුනාගත හැකි උපායශීලී සාධක (strategic factors) මොනවාද? ඔබගේ පිළිතුර ශ්‍රී ලංකාවේ ආහාර කර්මාන්තය මූලික කරගනිමින් විස්තර කරන්න. (ලකුණු 05)

ආ) දූරස්ථ පරිසරය ක්ෂණිකව වෙනස් වන බැවින් එම වෙනස්වීමට බලපාන පාරිසරික බලවේග හයක් (06) හඳුනාගෙන, එම එක් එක් බලවේග, සැබෑ ලෝකයේ උදාහරණ භාවිතයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

ඇ) ආයතනයක මූලික උපායශීලී තීරණ ගැනීමේ මට්ටම් මොනවාද? සරලව විස්තර කරන්න. (ලකුණු 05)

ඇ) බාහිර පරිසරයේ ඇති භෞතික පරිසරය (Physical Environment) වෙනස්වන විට සංවිධාන මුහුණ දෙන ප්‍රධාන අභියෝග මොනවාද? සැබෑ ලෝකයේ නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 05)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 02**

**ව්‍යාපාරික මට්ටමේ උපායන් තුළින් තරඟකාරීත්ව වාසි ලැබේ.**

අ) ව්‍යාපාර මට්ටමේ උපායන් තරඟකාරී උපායන් ලෙස හඳුනාගන්නේ ඇයි? ඊට හේතුව පැහැදිලි කරන්න. මෙම තරඟකාරී උපායන් සමාන කර්මාන්තවල කටයුතු කරන සමාගම්, අනුකරණය කෙරෙන්නේ කෙසේද ?

(ලකුණු 05)

ආ) අඩු පිරිවැය උපායන් (Low-cost Strategy) පැහැදිලි කර, සමාගම් විසින් එම තරඟකාරී උපායන් ගොඩනඟා ගන්නේ කෙසේද කියා විස්තර කරන්න.

(ලකුණු 05)

ඇ) උපායශීලී සන්ධාන (Strategic Alliances) සහ උපායශීලී කුමන්ත්‍රණ (Strategic Collusion) තරඟකාරී උපායන් ලෙස හඳුනාගත හැකිය. මෙම ප්‍රකාශනය සමඟ ඔබ එකඟ වන්නේද? කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

ඈ) "ක්‍රියාකාරී කළමනාකරුවන් (Functional Managers) තරඟකාරී උපායන් (competitive strategies) සංවර්ධනය කිරීම සඳහා සහාය නොදක්වති." මෙම ප්‍රකාශය විස්තර කරන්න.

(ලකුණු 05)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 03**

**ව්‍යාපාරික දැක්ම (Vision) සහ එහි මූලික මෙහෙවර ප්‍රකාශන (Mission Statement) ගොඩනැංවීමේදී සංවිධාන විසින් විවිධ ක්‍රම භාවිතා කරයි.**

අ) **සංවිධානයක දැක්ම (organisational vision)** යනු කුමක්ද? එය, මෙහෙවර ප්‍රකාශනයෙන් **(Mission Statement)** වෙනස්වන්නේ කෙසේද?

(ලකුණු 04)

ආ) ආහාරපාන කර්මාන්තයේ **(food and beverage industry)** ප්‍රසිද්ධ සමාගමක් සඳහා **මෙහෙයුම් ප්‍රකාශනයක්** **(Mission Statement)** සකස් කරන්න. ඔබගේ පිළිතුරට, මෙහෙයුම් ප්‍රකාශනයක අඩංගු **ප්‍රධාන අංග** **(characteristics)** ඇතුළත් කල යුතුයි.

(ලකුණු 06)

ඇ) පුරෝකථන මූලික සැලසුම් කිරීම **(Forecast-based Planning)** හා උපායශීලී සැලසුම් කිරීම **(Strategic Planning)** අතර වෙනස්කම් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 06)

ඈ) සමාගමක, විවිධ මට්ටම්වල උපායයන් **(Strategies)** එකිනෙකට වෙනස්වන්නේ ඇයි ?

(ලකුණු 04)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 04**

සංවිධාන තමන්ගේ **අභ්‍යන්තර ශක්තීන් සහ බාහිර අභියෝගයන්** විශ්ලේෂණය කිරීම සඳහා විවිධ විශ්ලේෂණාත්මක රාමුවන් (Analytical Frameworks) භාවිතා කරමින්, සංවිධාන සඳහා තිරසාර තරඟකාරීත්ව වාසි ලබාගැනීමට කටයුතු කරයි.

අ) **සම්පත් මූලික ප්‍රවේශය** (Resource-based Approach) **යටතේ VRIO රාමුව (Framework)** විස්තර කරන්න.

(ලකුණු 04)

ආ) සමාගම්වලට වටිනා සම්පත් සහ හැකියාවන් (resources and capabilities) තිබෙන විට, **තරඟකාරී වාසි** ලබා ගන්නේ කෙසේද කියා විස්තර කරන්න.

(ලකුණු 04)

ඇ) **මයිකල් පෝටර් ගේ පංච බලවේග විශ්ලේෂණය (Porter's Five Forces Analysis)** විස්තර කරන්න. සමාගමක් සූක්ෂම පාරිසරික සාධක (Task Environmental Factors) මඟින් බලපෑමට හා අධීක්ෂණය වන ආකාරය පහදන්න.
(ඔබගේ පිළිතුර තුළ එක් එක් සාධක පිළිබඳ පැහැදිලි විස්තරයක් ඇතුලත් විය යුතුය.)

(ලකුණු 12)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 05**

**සංවිධානවලට තම වෙළඳපොළ ස්ථානය ශක්තිමත් කර ගැනීමට හා දිගුකාලීන තිරසරභාවය රැක ගැනීමට විවිධ වූ වර්ධන උපායන් (growth) සහ විවිධාංගීකරණ (diversification) උපායන් භාවිතා කරයි.**

අ) කේන්ද්‍රීකරණ උපායයන් (Concentration Strategy) යනු කුමක්ද? ඔබගේ පිළිතුර සංයෝජන උපායයන් (Integration Strategies) තුලින් උදාහරණ මත පදනම්ව විස්තර කරන්න.

(ලකුණු 08)

ආ) අදාළ සම්බන්ධිත විවිධාංගීකරණ (Related Diversification) උපායයන්, වෙනත් විවිධාංගීකරණ උපායයන්වලට වඩා වැඩි වාසි ලබාදෙන්නේ කෙසේද? ඔබගේ පිළිතුර සුදුසු උදාහරණයක් සමඟින් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ඇ) වර්ධන - කොටස් න්‍යාස විශ්ලේෂණය (Growth-Share Matrix Analysis) යනු කුමක්ද? එය අදාළ පියවර හතර භාවිතයෙන් විස්තර කරන්න.

(ලකුණු 04)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 06**

**"සාර්ථක උපායන් සැලසුම් කිරීමකින්, (Strategy Formulation) සාර්ථක උපායන් ක්‍රියාත්මක කිරීමක් (Strategy Implementation) සහතික කල නොහැක."**

අ) සංවිධාන දෘෂ්ටිකෝණයෙන් බැලූ විට, සැලසුම් කළ උපායන් (strategy formulated) සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක (implement) නොවීමට හේතු කුමක් විය හැකිද?

(ලකුණු 08)

ආ) සමාගමක උපායන් **පාලනය** (Strategy Control) සහ උපායන් ඇගයීමේ ක්‍රියාවලියේ (Evaluation) පියවර විස්තර කරන්න. උපායන් සාර්ථකව ක්‍රියාත්මක වීමට, මෙම පියවර ආධාර වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ඇ) **උපායන් ඇගයීමේ ක්‍රියාවලිය තුළ, නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග** (Corrective Actions) අවශ්‍ය නොවන තත්ත්වයන් මොනවාද?

(ලකුණු 04)

**(මුළු ලකුණු 20)**